මගේ අංකය / எனது இல. / My No.: RG/NB/01/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல. / Your No.:

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos.: 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No.: 2889491

ඊමේල් / மின்னஞ்சல் / E-mail: info@rgd.gov.lk, rg@rgd.gov.lk

(71)

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No.: 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகத் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.rgdept.lk


දිනය / திகதி / Date: 2016.12. 7

චක්‍රලේඛ අංක 13/2016

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් සහ

අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

## පාරිතෝෂික දීමනා අනුමත කිරීම.

දෛනික අනුමත ඒකක ප්‍රමාණයට වඩා වැඩි ලේඛන ප්‍රමාණයක් ලියාපදිංචි කිරීම තුළින් පාරිතෝෂික දීමනා ලබා ගැනීමේ හැකියාව මත බොහෝ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවල වැඩි පිරිසක් අවිධිමත් ලෙස ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතුවල නියැලෙන බව නිරීක්ෂණය වේ. මෙසේ අවිධිමත් ලෙස ලියාපදිංචි කරන ලද ලේඛන තෙවන පාර්ශවයකට කියවා ගැනීමේ අපහසුව හේතුවෙන් විවිධ පැමිණිලි ලැබීම සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී.

02. එබැවින් ලියාපදිංචි කිරීමේ කාර්යයේ නිරතවන නිලධාරීන් වෙත ලියාපදිංචි කිරීම සඳහා ඔප්පු නිකුත් කිරීමේදී ඒ ඒ නිලධාරියාගේ ලියාපදිංචි කිරීමේ හැකියාව සලකා බලා ඒ අනුව ප්‍රමාණවත් ඔප්පු සංඛ්‍යාවක් නිකුත් කිරීමට කටයුතු කරන ලෙස ඔබට දන්වා සිටිමි.

03. තවද පාරිතෝෂික අනුමත කරවා ගැනීමට හා දීමනා ලබා ගැනීම සඳහා නිර්දේශයන් ප්‍රධාන කාර්යාලය වෙත එවීමේදී රෝ 876 ආකෘති පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කළ යුතු අතර ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් එය පරීක්ෂා කර එකී ලේඛන දිනපොතට භාරදී ඇති බවට සහතික කළ යුතුවේ. ලියාපදිංචි කිරීම සම්පූර්ණයෙන් අවසන් කරන ලද ලේඛන පමණක් පාරිතෝෂික ගණනය සඳහා අදාළ කරගත යුතු අතර එසේ නොවන අවස්ථාවන් පසුව අනාවරණය වුවහොත් ගෙවන ලද මුදල නැවත අයකර ගැනීමට පියවර ගන්නා අතර අදාළ නිලධාරීන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරන බවද දන්වා සිටිමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඩී. එම්. ගුණතිලක
රෙජිස්ට්‍රාර් ජනරාල්